# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,471 - 2026 ජනවාරි මස 09 වැනි සිකුරාදා - 2026.01.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | 64 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | 65 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ජනවාරි මස 30 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ජනවාරි මස 16 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


63 - B 082754 — - (2026/01)
F 1 -

# පළාත් සභා නිවේදන

## උතුරු පළාත් සභාව

උතුරු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නිවේදනය

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තිය සමග කියවිය යුතු 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ (252 පරිච්ඡේදය) 277 (1A) වගන්තිය යටතේ පවත්වන ලද පරීක්ෂණය**

01. උතුරු පළාතේ ආණ්ඩුකාරවර නාගලිංගම් වේදනායකන් වන මම, 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ (252 පරිච්ඡේදය) 2 වගන්තිය සමග කියවිය යුතු 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව 1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ (252 පරිච්ඡේදය) 277 වගන්තියේ (1A) (B) උපවගන්තිය යටතේ විශ්‍රාමික දිස්ත්‍රික් අධිකරණ මහෙස්ත්‍රාත්වරයා පෞද්ගලික විමර්ෂන මණ්ඩලයට මෙයින් පත් කරමි.

1947 අංක 29 දරන මහ නගර සභා ආඥාපනතේ (252 පරිච්ඡේදය) 277 වගන්තියේ (1) උපවගන්තියට අනුව පහත සඳහන් කරුණු/චෝදනා සම්බන්ධයෙන් වවුනියාව මහ නගර සභාවේ ක්‍රියාකාරකම් විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා මාස දෙකක් ඇතුළත වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා මම කන්දයියා ආරියනායකම් මහතා පත් කර ඇත්තෙමි.

02. විමර්ශනය කළ යුතු කරුණු/චෝදනා.-

i. නගර සභා ආඥාපනතේ 40 (1) (f) වගන්තිය ප්‍රකාරව සුදුසු අවසරයක් ලබා නොගෙන, පොලිස් ස්ථානය ඉදිරිපිට වවුනියාව නගර සභාවට අයත් ඉඩම කොටස්වලට බෙදා වෙළෙඳුන්ට බෙදා දීමෙන් නීතියෙන් පවරා ඇති බලතල අනිසි ලෙස භාවිතා කිරීම.

ii. පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති වවුනියාව නගර සභාවට අයත් ඉඩම, සභා යෝජනාව සම්මත නොකර, කොටස්වලට බෙදා වෙළෙඳුන්ට බෙදා දීමෙන් නීතියෙන් ලබා දී ඇති බලතල අනිසි ලෙස භාවිතා කිරීම.

iii. පොලිස් ස්ථානය ඉදිරිපිට ඇති වවුනියාව නගර සභාවට අයත් ඉඩම කොටස්වලට බෙදා වෙළෙඳුන්ට බෙදා දීමේ දී රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුගමනය නොකිරීමෙන් රාජකාරි ඉටු කිරීමේ දී විෂමාචාරය.

iv. පොලිස් ස්ථානය ඉදිරිපිට වවුනියාව නගර සභාවට අයත් ඉඩම කිසිදු ගිවිසුමක් හෝ කොන්දේසියක් අත්සන් නොකර, කොටස් වලට බෙදා වෙළෙඳුන්ට බෙදා දීමෙන් අකාර්යක්ෂමතාව සහ වැරදි කළමනාකරණය සිදු කරන ලදී.

v. පොලිස් ස්ථානය ඉදිරිපිට වවුනියාව නගර සභාවට අයත් ඉඩම කොටස්වලට බෙදා වෙළඳුන්ට බෙදා දුන් විට, රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව එම ඉඩම් තක්සේරු කර කිසිදු බදු ගෙවීමක් ලබා ගැනීමට අපොහොසත් වූ අතර එමගින් එහි රාජකාරි උල්ලංඝනය විය.

vi. තිරුනාවත්කුලම් ප්‍රධාන ඇළේ කැණීම් සහ අලුත්වැඩියා කටයුතු සම්බන්ධයෙන් නගර සභාවේ යෝජනාව ක්‍රියාත්මක නොකිරීමෙන් නීතියෙන් පවරා ඇති බලතල අනිසි ලෙස භාවිතා කිරීම.

vii. තිරුනාවත්කුලම් ප්‍රධාන ඇළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේ කොන්ත්‍රාත්තුව බණ්ඩාරවන්නියන් ප්‍රජා මධ්‍යස්ථානයට ප්‍රදානය කරන ලද අතර එය 2025.09.15 දින අත්සන් කරන ලදී. කොන්ත්‍රාත්තුව අත්සන් කරන ලද්දේ නගරාධිපතිවරයා විසින් පමණි. කොන්ත්‍රාත්තුව අත්සත් නොකර වැඩ ප්‍රදානය කිරීමෙන් නාගරික කොමසාරිස්වරයා මහ නගර සභා ආඥාපනතේ 227 වගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කළේය.

viii. තිරුනාවත්කුලම් ප්‍රධාන ඇළ මාර්ගය හැරීමේ දී කැණීම් කරන ලද පස් මැනීමට ලක් නොකළ අතර නිශ්චිත ප්‍රමාණය ලබා නොගත් අතර කැණීම් කරන ලද පස් විවිධ ස්ථානවලට බැහැර කරන ලද අතර, එහි ප්‍රතිඵලයක් ලෙස රාජකාරි පැහැර හැරීමක් සිදුවිය.

නාගලිංගම් වේදනායගන්,
උතුරු පළාත් ආණ්ඩුකාරවර.

2025 දෙසැම්බර් මස 31 දින,
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය,
පැරණි උද්‍යානය,
චුණ්ඩිකුලි,
යාපනය.

01-129

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මධ්‍යම පළාත් තාක්‍ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණිය / එක් වසරක පුහුණු ශ්‍රේණිය / දෙවසරක පුහුණු ශ්‍රේණිය තනතුරු සඳහා බඳවා ගැනීම (විවෘත) - 2025 සඳහා අයදුම්පත් භාරගන්නා අවසාන දිනය දීර්ඝ කිරීම

අංක 2,468 හා 2025.12.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ 12-541/1 නිවේදනය යටතේ පළකර තිබූ මධ්‍යම පළාත් තාක්ෂණ සේවයේ (සිවිල්) III ශ්‍රේණිය / එක් වසරක පුහුණු ශ්‍රේණිය / දෙවසරක පුහුණු ශ්‍රේණිය තනතුරු පුරප්පාඩුවලට බඳවා ගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2026.01.23** දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. එය අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කාරුණිකව දැනුම් දෙමි.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

01-174/1

---

සංශෝධනයයි

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ නිලධාරී ( ප්‍රමාණ සමීක්ෂක) තනතුරට බඳවා ගැනීම (විවෘත) - 2025

අංක 2,468 හා 2025.12.19 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* 12-541/2 නිවේදනය යටතේ පළකර තිබූ මධ්‍යම පළාත් ඉංජිනේරු සේවා දෙපාර්තමේන්තුවෙහි අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික සේවා ගණයෙහි තාක්ෂණ නිලධාරී (ප්‍රමාණ සමීක්ෂක) තනතුරු පුරප්පාඩුවලට බඳවා ගැනීමට අදාළ අයදුම්පත් කැඳවීමේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය **2026.01.23** දින දක්වා දීර්ඝ කෙරෙන බව මෙයින් නිවේදනය කරමි.

02. එම නිවේදනයේ 1. පොදු සුදුසුකම් සඳහන් ඡේදයෙ හි අනු අංක 1.3 හි සඳහන් 1991.01.09 යන දිනය 1996.01.09 යන දිනය වශයෙන් සංශෝධනය කරනු ලැබේ.

03. තව ද, එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බව ද කාරුණිකව දැනුම් දෙමි.

04. දැනටමත් මෙම විභාගය සඳහා අයදුම්කර ඇති අයදුම්කරුවන් මෙම සංශෝධනය හේතුවෙන් නැවතත් අයදුම්පත් යොමු නොකරන ලෙස නිවේදනය කරනු ලැබේ.

කේ.කේ.ජී.අයි.ඩී.පී. විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
මධ්‍යම පළාත් සභාව.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 244, කටුගස්තොට පාර,
මහනුවර.

01-174/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.